ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media
No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2026.03.24

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,

පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

දකුණු ආසියානු කලාපයේ රෝහලක ස්ථාපිත කළ පළමු 4D ඇන්ජියෝ CT පද්ධතිය සහිත ඒකකය ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ස්ථාපිත කෙරේ.

උපරිම ධාරිතාවයෙන් ප්‍රතිකාර සේවාවන් සිදුකරන ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයාගෙන් උපදෙස්

ජපන් රජයේ රුපියල් මිලියන 1000 කට අධික මූල්‍ය පරිත්‍යාගයෙන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ස්ථාපිත කරන ලද අතිනවීන තාක්ෂණයෙන් යුත් 4D Angio CT suite (4D ඇන්ජියෝ CT පද්ධතිය සහිත ඒකකය) සහ අංග සම්පූර්ණ නවීන දන්ත සෞඛ්‍ය ඒකකය (Dental Health Unit) ප්‍රතිකාර සේවාවන් සඳහා එක් කිරීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතාගේ ප්‍රධානත්වයෙන් මෙරට ජපාන තානාපති අකියෝ ඉසෝමාටා (H.E. Akio Isomata) මහතාගේ සහභාගීත්වයෙන් අද (24) පෙරවරුවේ දී එම රෝහල් පරිශ්‍රයේ දී සිදුවිය.

මෙම 4D ඇන්ජියෝ CT පද්ධතිය සහිත ඒකකය අති නවීන තාක්ෂණයෙන් යුක්ත වන අතර, මෙරට රාජ්‍ය සහ පෞද්ගලික රෝහල් පද්ධතියේ හෝ දකුණු ආසියානු කලාපයේ කිසිදු රෝහලක මෙවැනි අති නවීන තාක්ෂණයෙන් යුත් 4D ඇන්ජියෝ CT පද්ධතියක් මෙතෙක් ස්ථාපිත කර නොමැත.

මෙම යන්ත්‍රය සඳහා ජපන් රජය වැයකරන ලද මුදල රුපියල් මිලියන 925 කි.

අංග සම්පූර්ණ නවීන දන්ත සෞඛ්‍ය ඒකකය (Dental Health Unit) දන්ත පුටු (Dental chairs) 10 කින් සමන්විත වන අතර, මේ සඳහා ජපන් රජය වැයකර ඇති මුදල රුපියල් මිලියන 91 කි.

මෙතෙක් රෝහල තුළ දන්ත ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කර නොතිබුණ අතර නව ඒකකය විවෘත කිරීමත් සමග ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන ජනතාවට විශාල සහනයක් සැලසෙනු ඇත.

මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ජපන් රජය රුපියල් මිලියන 1016 ක මුදලක් වැයකර ඇත.

මෙහි දී අදහස් දක්වමින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා මෙම 4D CT ඇන්ජියෝ පද්ධතිය දකුණු ආසියානු කලාපයේම තිබෙන පළමු යන්ත්‍රය බවත්, රජයේ සහ පෞද්ගලික රෝහල් අංශයේ ද තවම පවතින්නේ 3D යන්ත්‍ර බව ද පැවසීය.

මෙම යන්ත්‍රය ජයවර්ධනපුර රෝහලේ උරුමයක් වූවත් මෙම යන්ත්‍රය රටටම හිමිකම ඇති දෙයක් බව ද සඳහන් කර සිටියේය.

දකුණු ආසියානු කලාපයටම විශේෂ වූ මෙම 4D CT Angio යන්ත්‍රය භාවිතා කර උපරිම පැය ගණනක් ප්‍රතිකාර සේවයේ යොදවමින් මෙරට රෝහල් පද්ධතියේ තිබෙන ගැටළුවලට විසඳුම් ලබා දිය යුතු බව සඳහන් කළ අමාත්‍යවරයා මේ සඳහා කාර්ය මණ්ඩලය අවශ්‍ය වේ නම් ලබා දීමට කටයුතු කරන බව ද අමාත්‍යවරයා පැවසීය.

මෙරට රජයේ රෝහල් පද්ධතිය තුළ විශාල වෛද්‍ය උපකරණ ප්‍රමාණයක් තිබෙන බවත්, එම උපකරණ එම ආකාරයෙන්ම භාවිතා නොවන බවත් අමාත්‍යවරයා මෙහි දී පෙන්වා දෙන ලදී.

රජයත්, විවිධ රාජ්‍යයන් ලබා දෙන අති නවීන තාක්ෂණික උපකරණ වලින් උපරිම ප්‍රයෝජන ගෙන මෙරට ජනතාවට උපරිම සේවාවක් ලබා දී පොරොත්තු ලේඛණවල සිටින රෝගීන් ප්‍රමාණය අවම කිරීමට කටයුතු කිරීම සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වගකීම බව ද හෙතෙම මෙහි දී පෙන්වා දෙන ලදී.

එමෙන්ම නවීණ තාක්ෂයෙන් යුත් Dental chairs 10 කින් සමන්විත ඒකකයක් රෝහලට අද ලැබුණු බවත්, එයින් ද උපරිම ධාරිතාවයෙන් ප්‍රතිකාර සේවාවන් සිදුකරන මෙන්ද අමාත්‍යවරයා අවධාරණය කර සිටියේය.

මෙම රෝහලේ තිබෙන වටිනාකම පිළිබඳව තවමත් මෙරට ජනතාවට නිසි අවබෝධයක් නොමැති බවද සඳහන් කළ අමාත්‍යවරයා එම වටිනාකම ජනගත කළ හැකිවන්නේ ප්‍රචාරය මගින් නොව සේවාව විධිමත්ව සහ කාර්යක්ෂමව ජනතාවට ලබා දීමෙන් බව ද පැවසීය.

නොමිලේ සේවාවන් සපයන රෝහල් තිබියදීත්, යම් සාධාරණ මුදලක් ගෙවා ජනතාවට ප්‍රතිකාර ලබා ගැනීමට මෙම රෝහල පෙර දවස ගොඩනැගූ බවත් මෙම රෝහල නිර්මාණය කිරීමේ දී පැවති ආර්ථික, ජීවන තත්ත්ව මේවන විට වෙනස් වී තිබෙන නිසාවෙන් මෙම ආකෘතිය වැඩිදියුණු කළ යුතු බව ඳ සඳහන් කර සිටියේය. ඒ වෙනුවෙන් පෙර සකස් කරන ලද පනත ප්‍රමාණවත් නොවන බව පෙනීයන බවත්, එම පනත වෙනස් කිරීමට සූදානම් බව ද අමාත්‍යවරයා මෙහිදී පැවසීය.

අලුත් යුගයට ගැලපෙන පරිදි නීති රීති වෙනස් කළ යුතු බවත් නව යුගයට ගැලපෙන පරිදි කාර්ය මණ්ඩලය, නවීණ උපකරණ ද පුළුල් කළ යුතු බව ද පැවසීය.

රෝහලේ ගරුත්වය, අභිමානය ආරක්ෂා කරගනිමින් මෙම රෝහල මෙරට විශිෂ්ට රොහලක් බවට පත් කිරීමට කටයුතු කරන මෙන් රෝහල් කාර්ය මණ්ඩලයෙන් අමාත්‍යවයා මෙහිදී ඉල්ලීමක් ද කරන ලදී.

හිටපු ජනාධිපති ජේ.ආර් .ජයවර්ධන මැතිතුමා සහ මෙරට ජනතාවට කරන ගෞරවයක් ලෙස ජපන් රජය මෙම රෝහල පරිත්‍යාග කළ බව සිහිපත් කළ අමාත්‍යවරයා මෙම රෝහල මෙරට ස්ථාපිත රෝහල් සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන 1200 කට අධික ප්‍රමාණය අතරින් තවත් එක් රෝහලක්ම පමණක් නොවන බවත්, මෙම රෝහල මෙරට සෞඛ්‍ය පද්ධතියේ පවතින සුවිශේෂී ආයතනයක් බව ද වැඩිදුරටත් මෙහි දී පෙන්වා දෙන ලදී.

රෝහලේ නිල වෙබ් අඩවිය ද අමාත්‍යවරයාගේ සුරතින් විවෘත කළ අතර ජපාන තානාපති අකියෝ ඉසෝමාටා (H.E. Akio Isomata) මහතා වෙත සමරු තිළිණයක් ප්‍රදානය කිරීම ද මෙහි දී සිදුකරන ලදී.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී දේවානන්ද සුරවීර මැතිතුමා,මහරගම නගර සභාවේ නගරාධිපති සමන් අමරකෝන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පද්මලාල් මානගේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයේ පීඨාධිපති මහාචාර්ය ප්‍රියකේ පලිපාන, වෛද්‍ය පශ්චාත් උපාධි පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය සුරංගි යසවර්ධන, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ සභාපති වෛද්‍ය තමර කළුබෝවිල, අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ධම්මික අලහපෙරුම, නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ප්‍රමිලා පීරිස් යන මහත්ම මහත්මීන් ඇතුළුව විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන්,හෙද ඇතුළු සමස්ත සෞඛ්‍ය කාර්ය මණ්ඩලය නියෝජනය කරමින් පිරිසක් ද, මෙරට ජපාන තානාපති කාර්යාලය නියෝජනය කරමින් නියෝජිතයන් පිරිසක් ද සහභාගි වී සිටියහ.

මාධ්‍ය ඒකකය
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය